**ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශය - 2017**

**------------------------------------------------**

ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 20 වගන්තිය සමග සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2) (සී) වගන්තිය ප්‍රකාර කාර්යාංශයේ වාර්ෂික වාර්තාව සමග ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**

**----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**

**---------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුලත් වේ. තෝරාගත් පරිපාටීන්,වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස කාර්යාංශයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාල වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් කාර්යාංශයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුලත් වේ. විගණනයේ විෂය පථය හා ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) හා (4) උපවගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් හා උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

**----------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා සම්මේලන කාර්යාංශයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ ප්‍රත්‍යාගණනය කර තිබූ මෝටර් රථයකට අදාලව සමුච්චිත ක්ෂය වෙන්කිරීම් රු.3,158,500 ක් එම ගිණුමෙන් ඉවත් කර නොතිබුණු අතර ප්‍රත්‍යාගණන අලාභය ලෙස රු.158,500 ක් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනයට හරකර තිබුණි. මේ හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ අතිරික්තය රු.158,500 කින් හා ප්‍රත්‍යාගණන අලාභය රු.3,000,000 කින් අඩුවෙන් සහ සමුච්චිත ක්ෂය වෙන්කිරීම රු.3,158,500 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ආ) පසුගිය වර්ෂය වෙනුවෙන් ලද ස්ථාවර තැන්පතු පොළිය රු. 1,249,988 රඳවාගත් ලාභයට ගැළපීම් කිරීම වෙනුවට සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම් ලෙස ගිණුම්ගත කර තිබුණි.

#### 2.2.2 විගණනය සඳහා සාක්ෂි නොවීම්

පිරිවැය රු.6,390,756 ක් වූ කාර්යාල උපකරණ සහ ගෘහ භාණ්ඩ හා සවි කිරීම් සම්බන්ධයෙන් ස්ථාවර වත්කම් ලේඛනය හා භෞතික සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා කාර්යාංශයේ මූල්‍ය ප්‍රතිඵලය රු.69,511,190ක අතිරික්තයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු.30,895,865 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලය රු.38,615,325 කින් වර්ධනය වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී වෙළඳ වියදම් රු.23,349,194 කින් අඩු වී තිබීම හා ආදායම රු.15,984,164 කින් වැඩිවීම ඉහත මූල්‍ය ප්‍රතිඵලයෙහි වර්ධනයට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂ 04 ක මූල්‍ය ප්‍රතිඵල විග්‍රහ කිරීමේදී 2013 වර්ෂයේදී රු. 60,811,425 ක් වූ අතිරික්තය 2016 වර්ෂය වන විට රු. 30,895,865 ක් දක්වා පිරිහී තිබූ අතර නැවතත් 2017 වර්ෂයේදී රු. 69,511,190 ක් දක්වා වර්ධනය වී තිබුණි. කෙසේ වුවද, මූල්‍ය ප්‍රතිඵලයට සේවක පාරිශ්‍රමික හා ජංගම නොවන වත්කම් සඳහා ක්ෂය නැවත ගැළපීමේදී 2013 වර්ෂයේදී රු. 71,320,070 ක් වූ කාර්යාංශයේ දායකත්වය 2016 වර්ෂය අවසානයට රු.44,697,026 ක් දක්වා අඛණ්ඩව පිරිහී තිබූ අතර 2017 වර්ෂයේදී නැවතත් රු. 81,471,882 දක්වා වර්ධනය වී තිබුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

---------------------------

### 4.1 කාර්යසාධනය

---------------

#### 4.1.1 සැලසුම් කිරීම

-----------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 04 ඡේදය අනුව, අරමුණු සාක්ෂාත් කර ගැනීම ඉලක්ක කර ගත් ක්‍රියාකාරකම් ඇතුලත් වාර්ෂික ක්‍රියාකාරී සැලැස්මක් සකස් කල යුතු අතර, චක්‍රලේඛයේ (ඇ) උපවගන්තිය අනුව, අදාල වර්ෂය තුල වාර්ෂික අයවැය පදනම් කරගත් ප්‍රමුඛතා අනුව සකස් කළ ක්‍රියාකාරකම් සැලැස්ම (Activity Plan), ක්‍රියාත්මක කාල රාමුව (Time Line) හා එම ක්‍රියාකාරකම්වල අපේක්ෂිත නිමවුම් / ප්‍රතිඵල (Output/Outcome) ඊට ඇතුලත් කළ යුතුය. එහෙත් කාර්යාංශය විසින් පිළියෙල කර තිබූ ක්‍රියාකාරී සැලැස්ම එපරිදි පිළියෙලකර නොතිබුණි.

(ආ) වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම මගින් ඉදිරිපත් කර තිබූ අපේක්ෂිත අරමුණු හා ඉලක්කයන් වර්ෂය තුළදී ලඟාකර ගත්තේද යන්න තහවුරු කර ගත හැකි ආකාරයට ප්‍රමාණාත්මක තොරතුරු ඇතුළත් කාර්යසාධන වාර්තා විගණනයට ඉදිරිපත් නොකෙරුණි.

#### 4.1.2 ක්‍රියාකාරීත්වය හා සමාලෝචනය

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2005 අංක 38 දරන සංචාරක කටයුතු පනතේ 42(2) වගන්තිය අනුව කාර්යාංශයේ පහත දක්වා ඇති පරමාර්ථ මෙතෙක් ඉටුකර ගැනීමට නොහැකි වී තිබුණි.

(i) ජාත්‍යන්තර, කලාපීය සහ දේශීය සම්මේලන, රැස්වීම් සහ ප්‍රදර්ශන පැවැත්වෙන ස්ථානයක් වශයෙන් හා පොළඹවන සුළු චාරිකාගමනාන්තයක් වශයෙන් ශ්‍රී ලංකාව සම්බන්ධීකරණයෙන් හා සහයෝගීතාවෙන් සංවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපොලෙහි ශ්‍රී ලංකාව පිළිබඳ අලෙවිකරණ කටයුතු සිදු කිරීමට වගබලා ගැනීම සඳහා සැළසුම් කළ පොදු ප්‍රතිපත්තියක් ඇතිකර ගැනීම.

(ii) සම්මේලන,රැස්වීම්,ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා වැඩසටහන්වල විවිධ අංශවල නිරතව සිටින තැනැත්තන්ට සහ සංවිධානවල වෘත්තීමය ප්‍රමිති නියම කිරීම සහ එම ප්‍රමිති පවත්වාගැනීම බලාත්මක කිරීම.

(iii) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා පිළිබඳ විවිධ අංශවල කටයුතු කිරීමෙහි නියැලී සිටින විවිධ ගණවල තැනැත්තන්ගේ හෝ සංවිධානවල වෘත්තීය නිපුණතා සංවර්ධනය දිරිමත් කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(iv) සම්මේලන, රැස්වීම්, ප්‍රදර්ශන සහ පොළඹවන සුළු චාරිකා සංවර්ධනය කිරීමේ සහ ප්‍රවර්ධනයකිරීමේ නිරතව සිටින යම් සංගම් හෝ සංවිධාන සමඟ අනුබද්ධවීම, ඒවායේ සාමාජිකත්වය ලබා ගැනීම හෝ ඒ යම් සංගම් හෝ සංවිධාන සමග ගිවිසුම්වලට ඇතුලත් වීම.

(v) ශ්‍රී ලංකාවෙහි මෙන්ම විදේශයන්හි ශ්‍රී ලංකාව සංචාරක හා චාරිකා ගමනාන්තයක් ලෙස සංවර්ධනය කිරීම,ප්‍රවර්ධනය කිරීම සහ සංචාරක වෙළෙඳපොලෙහි අළෙවි කිරීම සඳහා කාර්යාංශයට මගපෙන්වීම ලබාදීම.

(vi) සත්කාරක සේවා ඇතුලුව ප්‍රමාණවත්, ආකර්ශනීය සහ කාර්යක්ෂම සංචාරක සේවා, අඛණ්ඩව පවත්වාගෙන යා හැකි ආකාරයට සංවර්ධනය කිරීම සහ ප්‍රවර්ධනය කිරීම.

(ආ) වාර්ෂික කාර්යසාධන වාර්තාව අනුව ප්‍රධාන ක්‍රියාකාරකම් 09 ක් සඳහා රු.මිලියන 312.45 ක් වෙන්කර තිබූ නමුත් වර්ෂය තුළ උපයෝජනය කර තිබුණේ රු.මිලියන 84.45 ක් හෙවත් සියයට 27 ක් පමණක් වූ අතර එම ක්‍රියාකාරකම් යටතේ ව්‍යාපෘති 128 ක් නිම කිරීමට සැලසුම් කර තිබුණද නිමකර තිබුණේ ව්‍යාපෘති 84 ක් පමණි.

**4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්**

2017 සැප්තැම්බර් මස 21 හා 22 යන දිනයන්හි රු.7,005,069 ක වියදමක් දරා පවත්වන ලද IMEX TRADE FAIR ප්‍රවර්ධන වැඩසටහන සඳහා සහභාගී වූ දේශීය නියෝජිතයන් විසින් ශ්‍රී ලංකාව නියෝජනය කරමින් ස්ථානගත කර තිබූ කුටිය සඳහා හතර දෙනෙකු පමණක් පැමිණි බවත්, ආයෝජන ප්‍රතිඵලය ශුන්‍ය බවත් ප්‍රවර්ධන වැඩසටහන සම්පූර්ණයෙන්ම අසාර්ථක බවත්, ඔවුන්ගේ පසු විපරම් වාර්තාවල අදහස් යටතේ කාර්යාංශය වෙත දන්වා තිබීම හේතුවෙන් එම වැඩසටහනින් අපේක්ෂා කර තිබූ අරමුණු ඉටු වූවේද යන්න පිළිබඳව විගණනයේදී ගැටලු සහගත විය.

**4.3 අරමුදල් ඌන උපයෝජනය**

සමාලෝචිත වර්ෂයේදී අරමුදල් කළමනාකරණ ගිණුමේ රු.137,737,994 ක පමණ සාමාන්‍ය මුදල් ශේෂයක් පැවතියද එම මුදල් ඵලදායී ආයෝජනයක යෙදවීම කෙරෙහි කළමනාකරණය විසින් අවධානය යොමු කර නොතිබුණි.

**4.4 කාර්යමණ්ඩල පරිපාලනය**

බඳවා ගැනීමේ පරිපාටියට අනුව මූලික සුදුසුකම් සපුරා නොමැති, නිලධාරියෙකු සාමාන්‍යාධිකාරී තනතුර සඳහා බඳවා ගෙන 2016 දෙසැම්බර් සිට 2017 ජනවාරි දක්වා කාලය සඳහා වැටුප් හා දීමනා ලෙස රු.483,372 ක් ගෙවා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේ පෙබරවාරි සිට දෙසැම්බර් 31 දක්වා එම තනතුර පුරප්පාඩුව පැවතුණු අතර කළමනාකරු පරීක්ෂණ හා සංවර්ධන තනතුර ද අවුරුදු 3 ක සිට පුරප්පාඩුව පැවතුණි.

## 5. තිරසාර සංවර්ධනය

-------------------------

### 5.1 තිරසාර සංවර්ධන අරමුණු ලඟා කර ගැනීම

---------------------------------------------------

2017 අගෝස්තු 14 දිනැති අංක එන්පී/ එස්පී/ එස්ඩීජී/ 17 දරන ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යාංශයේ ලේකම් විසින් නිකුත් කරන ලද ලිපිය හා තිරසාර සංවර්ධනය පිළිබඳ එක්සත් ජාතීන්ගේ වසර " 2030 න්‍යාය පත්‍රය" ප්‍රකාරව සෑම රාජ්‍ය ආයතනයක් විසින්ම කටයුතු කළ යුතු අතර ඒ අනුව කාර්යාංශය විසින් නව විෂය පථය යටතට වැටෙන කාර්යයන් සම්බන්ධයෙන් කෙසේ ක්‍රියාත්මක විය යුතුද යන්න සම්බන්ධයෙන් දැනුවත් වී තිබුණද තිරසර සංවර්ධන අරමුණු, ඉලක්ක හා එම ඉලක්ක කරා ළඟා විය යුතු සන්ධිස්ථානයන්ද ඉලක්ක මත ළඟාවීම් මැන බැලීම සඳහා වන දර්ශකයන්ද හඳුනා ගැනීම සිදු කර නොතිබුණි.

## 6. ගිණුම් කටයුතුභාවය හා යහපාලනය

----------------------------------------

### 6.1 අභ්‍යන්තර විගණනය

-------------------------

කාර්යාංශයේ අභ්‍යන්තර විගණන කටයුතු සඳහා අභ්‍යන්තර විගණන අංශයක් පිහිටුවා නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයට අදාළ ගනුදෙනු රේඛීය අමාත්‍යාංශයේ අභ්‍යන්තර විගණන අංශය මගින් හෝ පරීක්ෂාවට ලක් කර නොතිබුණි.

### 6.2 ප්‍රසම්පාදනයන්

-------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2006 ජනවාරි 25 දිනැති රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 4.2.1 අනුව ප්‍රධාන ප්‍රසම්පාදන සැලැස්මක් පිළියෙලකර නොතිබුණි.

(ආ) ප්‍රවර්ධන වැඩසටහන් 02 කට අදාලව කුටි ඉදිකිරීම වෙනුවෙන් රු.6,732,588 ක වියදමක් දරා තිබූ නමුත් ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 5.3.1 අනුව විධිමත් ලෙස සකස් කල ලංසු ලියවිලි භාවිතා කර නොතිබූ අතර ලංසු ලියවිලි තාක්ෂණ ඇගයීම් කමිටුව විසින් සමාලෝචනය කිරීමද සිදුකර නොතිබුණි. තවද, 2006 ප්‍රසම්පාදන අත්පොතේ අතිරේඛ 2.14.1 අනුව ලංසු කැඳවීම හා ලංසු කැඳවීමේ ක්‍රමවේදය සඳහා දෙපාර්තමේන්තු ප්‍රසම්පාදන කමිටුවෙන් අනුමැතිය ලබා ගෙන නොතිබූ අතර ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 8.7.1 අනුව විධිමත් ලෙස පිළියෙල කල කොන්ත්‍රාත් ප්‍රදානය කරන ලද ලිපියක්ද නිරීක්ෂණය නොවීය.

### 6.3 අයවැය පාලනය

-------------------

සමලෝචිත වර්ෂයේදී අයවැයගත හා තත්‍ය සංඛ්‍යා අතර සියයට 25 සිට සියයට 100 ක් දක්වා පරාසයක විචලනයක් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබූ බව විගණනයේදී නිරීක්ෂණය විය.

## 6.4 වාර්ෂික වාර්තා සභාගත කිරීම

2015 සහ 2016 වර්ෂවලට අදාලව කාර්යාංශයේ වාර්ෂික වාර්තා 2018 ජූලි 30 දින වන විටත් පාර්ලිමේන්තුවේ සභාගත කර නොතිබුණි.

## 7. පද්ධති හා පාලනයන්

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර කාර්යාංශයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණය |
|---|---|
| (අ) අයවැය පාලනය. | අයවැය හා තථ්‍ය සංඛ්‍යා අතර විචලතාවයන් අවම කර ගැනීම කෙරෙහි අවධානය යොමු නොකිරීම. |
| (ආ) මෙහෙයුම් පාලනය | (i) විදේශ ප්‍රවර්ධන සඳහා සහභාගී වූ දේශීය නියෝජිතයන්ගේ පසු විපරම් වාර්තා ලබා නොගැනීම.<br>(ii) ප්‍රවර්ධන වැඩසටහන් අවසානයේදී සහභාගී වූ නිලධාරීන්ගෙන් ප්‍රගති වාර්තා නොගැනීම. (Satisfaction Report) |